**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය (මාර්ගගත), තෙවන වසර - 2021**

**සාක්ෂි හා අපරාධ නඩු විධාන නීතිය**
(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

I වන හා II වන කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් ඔබ විසින් පිළිතුරු සැපයිය යුතු වේ.
ප්‍රශ්න තුනකට **(03) පමණක්** පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

I කොටස

01) තම ස්වාමි පුරුෂයා වූ ඔලිවර්ගෙන් වෙන් වීමෙන් පසු වර්ජිනියා, 2021 පෙබරවාරි මස 2 වන දින සිට අවුරුදු අටක් වූ තම පුත්‍රයා, තෝමස් සමඟ ඇගේ තට්ටු නිවාසයෙහි ජීවත් විය. 2021 ජූලි මස 21 වන දින වර්ජිනියා ඔලිවර්ට ඊ මේල් පණිවිඩයක් යවමින් කියා සිටියේ, 'ඔයා මට රුපියල් මිලියන 50ක් ගෙව්වේ නැත්තම් ඔයාගේ සියලුම දූෂිත ගණුදෙණු මම පොලිසියට අනාවරණය කරනවා' ලෙසටයි. අගෝස්තු 4 වන දින, වර්ජිනියා කොල්ලුපිටිය පොලිස් ස්ථානාධිපතිවරයාට ලිපියක් ලියමින් ඔලිවර්ගේ දූෂිත ගණුදෙණු පිළිබඳව පැමිණිලි කරන ලද අතර ඇය සඳහන් කර තිබුනේ, 'මෙම රහස් හෙළිදරව් කිරීමෙන් මා විසින් සතුරන් ඇති කරගන්නා ලද බවයි'. 2021 සැප්තැම්බර් 10 වන දින උදැසන, තෝමස් විසින් වෙඩි වැදීමෙන් ලත් තුවාල සහිත වූ වර්ජිනියාගේ මෘත දේහය ඇගේ තට්ටු නිවාසයේ දී සොයා ගන්නා ලදි. මෘත දේහය අසල හිස් පිස්තෝල පතරොම් තුනක් ද සොයා ගන්නා ලදි. තෝමස් පොලිසියට ප්‍රකාශ කලේ: 'අම්මා මැරුණු දවසේ රෑ තාත්තා හදිසියේ කළුවරේම ඇවිල්ලා කිව්වා, "මම ඔයාගේ අම්මව සාතන් (යක්ෂයා) ගාවට යැව්වා."' පොලිසියට ඔලිවර් සොයාගත නොහැකි වූ අතර ඔහුගේ ජංගම දුරකථනය සැප්තැම්බර් 13 වනදා

තෙක්ම ක්‍රියා විරහිත කර තිබුණි. නමුත් එදිනම ඔහු කොල්ලුපිටිය පොලිස් ස්ථානයට පැමිණ පැහැදිලි කලේ, ඔහු යාල ප්‍රදේශයේ සිටි බවත් එම ප්‍රදේශයේ ජංගම දුරකථන ආවරණයක් නොපවතින බවත්ය. පොලිසිය විසින් ඔලිවර්ව අත්අඩංගුවට ගෙන ඔහුගේ තුවක්කුව පොලිස් භාරයට ගන්නා ලදි. ඩෙන්වර් ප්‍රකාශ කරන පරිදි, ඔලිවර් නිරන්තරයෙන් යාල පිහිටි ඩෙන්වර්ගේ කඳවුරු භූමියේ නවාතැන් ගන්නා අතර සැප්තැම්බර් 9 වන දින සිට 13 වන දින දක්වා ඔලිවර් කඳවුරු භූමියේ නතර වී, දඩයම් කිරීම හා ඉලක්කය ගැනීමට පුහුණු වූ බවයි. ඔලිවර් තම ප්‍රකාශයේ දක්වා සිටියේ: 'වර්ජිනියා සතුරන් බොහෝ දෙනෙක් ඇති කරගත්තා...තෝමස් නිරතුරුවම මායා රූප දැකීමෙන් පීඩා විදිනවා. ඔහු මින් පෙරත් යක්ෂයන් හා සුරදූතයන් ගැන කතා කර තිබෙනවා' ලෙසයි.

වර්ජිනියාගේ මිනීමැරුම සම්බන්ධයෙන් ඔලිවර් වෙත අධිචෝදනා ගොනු කරන්නේ නම්, ඉහත දක්වන ලද සිද්ධිමය කරුණුවල අනුකූලතාවය (relevancy) 1895 අංක 14 දරණ (සංශෝධිත) සාක්ෂි ආඥා පනතේ විධිවිධාන හා නඩු තීරණ නීතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

(100% ලකුණු)

02) නීතිවිරෝධීව දැව කැපීම සම්බන්ධයෙන් සැක පිට යාල කැළෑ නිළධාරීන් විසින් සිරිමල්ව අත්අඩංගුවට ගන්නා ලදි. ප්‍රශ්න කිරීම් අතරතුර, කැළෑ නිළධාරියෙක් වූ ජානක, සිරිමල්ට ප්‍රකාශ කලේ: 'මේ දැව කැපීමේ ව්‍යාපාරය පසුපස සිටින මහමොලකරුවන් ගැන ඇත්ත කියනවා නම් අපි ඔයාට විරුද්ධව චෝදනා ගොනු කරන්නේ නෑ' ලෙසයි. නමුත් සිරිමල් නිශ්ශබ්දව සිටින ලදි. පසුව සිරිමල්ව පොලිස් ස්ථානය වෙත භාර දුන් විට, එම අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරී (ASP) ජයසේන පොලිස් ස්ථානයට පැමිණියේය. සිරිමල් ASP වෙත කියා සිටියේ: 'දැව කැපීමට චන්දන සර් මට ගෙවනවා. චන්දන සර් මේ දැව සිල්වාට විකුණනවා' ලෙසයි. සිරිමල්ගේ ප්‍රකාශය මත පදනම් වෙමින් කැළෑ නිළධාරීන් විසින් චන්දනව සහ සිල්වාව අත්අඩංගුවට ගත් අතර සිල්වාගේ දැව ගබඩාව නිළධාරීන්ගේ භාරයට ගන්නා ලදි. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී සිල්වා පොලිසියට කියා සිටියේ: 'මම අහිංසකයි. මම කරපු එකම දේ වෙන්නේ

චන්දනගෙන් හා සිරිමල්ගෙන් දැව මිලදී ගැනීම විතරයි'. සිරිමල්ව, චන්දනව හා සිල්වාව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කල විට, සිරිමල් අනාවරණය කරන ලද්දේ: 'මම ගස් කැපුවේ චන්දනගේ උපදෙස්වලට අනුවයි...චන්දනයි සිල්වයි බොහෝ නීති විරෝධී වැඩවලට සම්බන්ධයි' ලෙසයි.

සිරිමල්ගේ හා සිල්වාගේ ප්‍රකාශවල ආවේශ්‍යතාවය (admissibility) ශ්‍රී ලංකාවේ අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීරණ නීතිය ඇසුරින් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(100% ලකුණු)

03) පහත සඳහන් ප්‍රකාශයන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. සාක්ෂි නීතියේ අදාළ අධිකාරීන්ගෙන් ඔබගේ පිළිතුර සනාථ කරන්න.

(අ) "විශේෂ නිපුණත්වය" යන වචනය (1895 අංක 14 දරණ සාක්ෂි ආඥා පනතේ 45 වන වගන්තිය) වෘත්තීමය වශයෙන් පුහුණුව ලත් විශේෂඥයන්ට සීමා නොවේ.

(50% ලකුණු)

සහ

(ආ) අපරාධ නඩුවක දී යම් පුද්ගලයෙකුගේ චරිතය යන්න ඔහුගේ චර්යාව පැහැදිලි කිරීමේලා සහ ඔහුගේ නිර්දෝෂිභාවය හෝ සාපරාධීභාවය නිශ්චය කිරීමේලා වැදගත් කරුණක් වේ'.

(50% ලකුණු)

04) 2021 අගෝස්තු මස 10 වන දින පානදුර ප්‍රදේශයේ සිදු වූ සොරකමකට සම්බන්ධ සැකකරුවන් සොයා, පොලිසිය විසින් 2021 අගෝස්තු මස 12 වන දින උදෑසන කළුතර ප්‍රදේශයේ නවාතැන්පොළකට ඇතුළුවෙන ලදි. එවිට සරත් හා මහේල පැන යෑමට උත්සහ කිරීමේදී පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි. සරත්ගේ කාමරයේ අල්මාරිය තුල තිබී රත්‍රං ආභරණ පෙට්ටියක් පොලිසිය විසින් සොයා ගන්නා ලදි. විමර්ශනය අතරතුර සරත් හා මහේල ප්‍රකාශ කර සිටියේ ඔවුන් එම

ආභරණ පෙට්ටිය පිළිබඳව කිසිවක් නොදන්නා බවත්, ඔවුන් අගෝස්තු 11 වන දින රාත්‍රියේ ත්‍රිකුණාමලයේ සිට පැමිණි බවත්ය.

ඔබ, සරත් හා මහේල වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා යැයි උපකල්පනය කරමින්, නඩුවේ පහත කරුණු ඔබ කෙසේ ආමන්ත්‍රණය කරන්නේ ද යන්න 1895 අංක 14 දරණ සාක්ෂි ආඥා පනතේ අදාල ප්‍රතිපාදන හා නඩු තීරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(අ) ඔප්පු කිරීමේ භාරය (33.33% ලකුණු)
(ආ) පූර්ව නිගමන (33.33% ලකුණු)
(ඇ) සාක්ෂි තහවුරු කිරීම (33.33% ලකුණු)

---

## II කොටස

05) 2021 ජුලි මස 19 වන දින, පැලියගොඩ කළු සමාගමේ බහාලුම් අංගනයකදී, දැඩි ලෙස තුවාල ලබා සිටි පුද්ගලයෙක් සොයා ගන්නා ලදි. කළු සමාගමේ කළමනාකාරවරුන් පොලිසියට දන්වා සිටියේ, ඔවුන්ගේ සේවකයෙක් වූ සුනිල් මෙම පහර දීම කල බවට ඔවුන් සැක කරන බවයි. සුනිල් ජීවත් වන්නේ මත්ද්‍රව්‍ය ජාවාරම හා සංවිධානාත්මක ගණිකා ව්‍යාපාරය සම්බන්ධයෙන් දුෂ්ප්‍රසිද්ධයට පත් 'රතු පාර' නම් ප්‍රදේශයේය. සුනිල්ගේ නීතිඥවරයා ඔහු වෙනුවෙන් අපේක්ෂිත ඇපයක් සාර්ථක ලෙස ලබා ගන්නා ලදි. 2021 ජුලි 30 වන දින, ඔවුන්ගේ එක් බහාලුමක් සොරාගෙන ඇති බවට කළු සමාගම වෙතින් පොලිසිය වෙත පැමිණිල්ලක් ලැබිණි. 2021 ජුලි මස 30 වන දින උදෑසන, සුනිල් බහාලුම් අංගනය වෙත ඇතුළු වන විට, පොලිස් නිළධාරීන් හතර දෙනෙකු හදිසියේ මතු වී ඔහුව බිමට තල්ලු කරන ලදි. නිළධාරීන් තුන් දෙනෙකු විසින් සුනිල්ගේ මුහුණ පොළොවට තද කර අල්ලාගෙන සිටින අතරතුර අනික් පොලිස් නිළධාරීයා ඔහුට මාංචු දමන ලදි. සුනිල් කෑගසමින් ප්‍රකාශ කලේ: 'ඇයි ඔබලා මාව අත්අඩංගුවට ගන්නේ? ඔබලාට මාව අත්අඩංගුවට ගත නොහැක. මට ඇප දීලා තියෙන්නේ'.

සුනිල්ව පොලිස් භාරයට ගෙන, 2021 අගෝස්තු මස 2 වන දින පස්වරු 4.30 ට මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

සුනිල්ගේ නීතිඥවරයාගේ භූමිකාව උපකල්පනය කරමින්, අත්අඩංගුවට ගැනීම හා ඇප දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදාළ වන නීතිය හා නඩු තීන්දු අධිකාරීන් ඇසුරින්, සුනිල්ට ඔහුගේ අයිතිවාසිකම් හා ලබාගත හැකි ප්‍රතිකර්ම පිළිබඳව උපදෙස් දෙන්න.

(100% ලකුණු)

06) 'සාමාන්‍ය මූලධර්මය අර්ථනිරූපණය කිරීමේ දී පෙනී යන්නේ, යම් පුද්ගලයෙකු චෝදනා ලබා සිටින සෑම වෙනස් වරදක් සඳහාම වෙන වෙනම චෝදනා ගොනු කල යුතුවන බවයි, එකම දඬුවම් විධිවිධානය අදාළ වුවද විවිධ අවස්ථා වලදී සිදු කරන ලද වරදවල්ද "වෙනස් වැරදි" යන වචනය තුලට අන්තර්ගත වන බවට ප්‍රකාශ වී ඇත.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ ප්‍රතිපාදන හා නඩු තීරණ ඇසුරින් ඔබගේ පිළිතුර සාකච්ඡා කරන්න.

(100% ලකුණු)

*****